සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව

නිවාඩු කාලීන පැවරුම්

සිංහල භාෂාව හා සාහිත්‍යය - 9 ශ්‍රේණිය

නිවිතිගල අධ්‍යාපන කලාපය (සැකසුම -ඩබ්ලිව් .සී.සමරසිංහ )

අප්‍රේල් මාසය - 4 සතිය පුනරීක්ෂණ -4

1)නිවැරදි වචනය යොදා හිස්තැන් පුරවන්න

1.රෙදි ..... සේදූ අක්කා ....... යෙදුණු වචන ලියයි. ( පිළි , පිලි )

2. ........... තුළ සිටින මිනිසා මිරිස් ........... සිටුවා ඇත. (පැළ , පැල )

3. ....... මත සිටින මිනිසා ගිමන් හරින්නේ ............ පසෙකින් තබා ය. (කඳ ,කද )

4. .......... ගස වටා ............ ගස් වැවී ඇත. ( අබ , අඹ )

5. ............ පැයූ ............ මම සතුටු වෙමි. (4×5)

2)මෙම වාක්‍ය සඳහා සුදුසු තැන්හි විරාම ලක්ෂණ යොදන්න

1.ඔබට තෙරුවන් සරණයි2.ශ්‍රියානිගේ නිවස සිරි නිවස නමින් හඳුන්වයි

3.අයියෝ මගේ කකුල කැපුණා යි නංගී පැවසුව ය. (3×5)

3)සුදුසු අක්ෂර යොදා හිස්තැන් පුරවන්න

*න්‍යාෂ්...ක *ආහා....ය *සමස්...... *ක...ෂ්‍ය * පිළියෙ ..... (2×5)

4)මල් මල් වාරම් හරිමැ උදාරම් ... යන ගීතය ඇසුරෙන් මෙම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

1.ගීතයෙ ඇති අනුප්‍රාසවත් යෙදුම් 2ක් ලියන්න

2.කවියේ යොදා ඇති ව්‍යංග්‍යාර්ථවත් යෙදුම් 2ක් ලියන්න

3.මේ ගීතය පිළිබඳ කෙටි රසාස්වාදයක් ලියන්න

4.මෙහි එන පොකුණු සිනා වෙන්නේ ඇයි? 5.මනාලියක් වීඇති ගස කුමක් ද? (3×5)

5) කෙටි පිළිතුරු සපයන්න

1.ජනශ්‍රැති යනු මොනවා ද? 2.මග දිගට ජන කතා කෘතියේ කතුවරයා කවුද?

3.ජාතික නර්තන දිනය කවදා ද? 4.සිංහල අක්ෂර මාලාවේ 'ප' වර්ගයේ අක්ෂර ලියා දක්වන්න.

5.ණ , න යන අක්ෂර නිවැරදි ව යොදා වාක්‍ය 5. තනන්න. (4×5)

6) මගේ හොඳ ම මිතුරා මැයෙන් රචනයක් ලියන්න (20)